සියලුම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

21064

10 ශ්‍රේණිය

වර්ෂ අවසාන පරීක්ෂණය - 2022(2023)

21 | S | I.II

නම: ..........................................

## සිංහල භාෂාව හා සාහිත්‍යය

කාලය පැය දෙකයි

### I කොටස

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3) ,(4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයෙහි එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (✱) ලකුණ යොදන්න.
- දී ඇති උපදෙස් සියල්ල සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.

- අංක 01 සිට 03 දක්වා ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි ඉරි ඇඳි කොටසේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන උත්තරය තෝරන්න.

01. සමහර රටවල ක්‍රියාත්මක වන්නේ කැලෑ නීතිය බව බොහෝ දෙනා පවසති.
 1. රජකාලයේ නීතිය 2. ඇඳිරිනීතිය
 3. බලවතා විසින් දුබලයා පෙළීමේ නීතිය 4. හදිසි නීතිය

02. නව ප්‍රතිපත්ති පිළිගැනීමට ඇතැමුන් තුළ ඇති හුඹස් බිය රටේ සංවර්ධනයට විශාල බාධකයක් ව පවතී.
 1. රෝග බිය 2. අස්ථාන බිය 3. මර බිය 4. සතුරු බිය

03. ඇතැම් රූපවාහිනී නාලිකා ඔස්සේ ප්‍රදර්ශනය කරන දූත්වීම් නිසා හය හතර නොතේරෙන දරුවන්ගේ මනස විකෘති තත්ත්වයට පත්වෙතැයි ඇතැම්හු පවසති.
 1. එකතු කිරීමට නොදන්නා
 2. පන්සිල් අටසිල් නොදන්නා
 3. සමාජය පිළිබඳ අවබෝධයක් නැති
 4. දැනුම් තේරුම් නොමැති

අංක 04 සිට 06 දක්වා ප්‍රශ්නවල හිස්තැන්වලට ගැළපෙන වඩාත් සුදුසු පදය තෝරන්න.

04. නූතන කවීන්ගේ .................................. කවීත්වය විචාරකයන්ගේ ඇගයීමට ලක්වේ.
 1. ප්‍රතිෂ්ඨාපිත 2. ප්‍රතිභාපූර්ණ 3. ප්‍රතියෝජනීය 4. ප්‍රතිපූර්ණ

05. සිංහල ජන කවිය .................................. පහළ වූවක් නොවන බව ජන කවි පිළිබඳව අධ්‍යයනය කරන්නන්ගේ මතයයි.
 1. ආස්වාදජනකව 2. ආධ්‍යාත්මික 3. අභිභවනීයව 4. ආකස්මිකව

06. ටී.බී. ජායා මහතා මුස්ලිම් දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් .................................. සේවාවක් කළ අයෙකි.
 1. විශිෂ්ට 2. ප්‍රවිෂ්ට 3. කනිෂ්ඨ 4. නිර්දිෂ්ට

07. සෑම පදයකම අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.
 1. පරිසණක, ප්‍රධානෝත්සවය, ලේඛන, පුස්තකාලය
 2. කාර්යාලය, ජනශූන්‍ය, කලමනාකරු, පරිවර්ථනය
 3. විරෝදාර, සමස්ත, ලේකම්, විස්මය
 4. පිලිවෙත්, මධ්‍යසාර, ප්‍රතිනිර්මාණය, සුරක්ෂිත

08. ප්‍රවණතා, භීෂණය, රුහුණ, කුරුමානම යන පදවල පළමු අකුරේ ඇති පිල්ලම අනුපිළිවෙලින් දක්වෙන වරණය තෝරන්න.
 1. රකාරාංශය, දීර්ඝ ඉස්පිල්ල, කෙටි පාපිල්ල, දීර්ඝ පාපිල්ල
 2. දීර්ඝ පාපිල්ල, ඇලපිල්ල, කෙටි ඉස්පිල්ල, කෙටි පාපිල්ල
 3. පාපිල්ල, ඉස්පිල්ල, කෙටි ඇදය, දීර්ඝ පාපිල්ල
 4. රකාරාංශය, දීර්ඝ ඉස්පිල්ල, කෙටි ඇදය, කෙටි පාපිල්ල

09. ආකාරාදී පිළිවෙල නිවැරදිව දක්වෙන පද පේළිය තෝරන්න.
1. ගගනී, ධරනී, පවනී, සචීනී, හෂිනී
2. සිංහබාහු, හුණුවටය, තලමල පිපිලා, මහාසාර, මනමේ
3. රංගකලාව, ඉතිහාසය, බුද්ධ ධර්මය, විද්‍යාව, ගණිතය
4. ගාල්ල, මාතර, හම්බන්තොට, මිරිස්ස, කතරගම

10. එකම වර්ගයේ යුගලපද පමණක් සහිත වරණය තෝරන්න.
1. සැපසනීප, දුකසැප, ඉඳුම්හිටුම්, ඉඩම් කඩම්
2. ගරුනම්බු, වාදභේද, හුරුපුරුදු, අරුමපුදුම
3. උදවු පදවු, ඔප්පුතිරප්පු, අස්පස්, සෙරෙප්පු බෙරෙප්පු
4. තුටු පහටු, සතුටු සාමීචි, ගනුදෙනු, රැකීරක්ෂා

11. උක්ත නාමපද දෙකක් සහ අනුක්ත නාම පද දෙකක් යෙදී ඇති වරණය තෝරන්න.
1. කාන්තාවක, මිනිසෙක්, ගැහැනුන්, ක්‍රීඩකයෙක්
2. සිඟන්නියක, අයෙක්, මවක්, දඩයක්කරුවෙක්
3. මිනිස්සු, ගැහැණු, ළමයි, තරගකරුවෝ
4. අඟනක, ශිල්පිනියක, සෙන්පතියකු, රජිනක

12. උපසර්ග පදයක් ඇතුළත් නොවන වරණය තෝරන්න.
1. උපවනය,දුශ්ශීල,අධිගෘහිත, අතිවිශාල, උපනායක
2. විරකියා, අබල, සුපිරිසිදු, පරිකල්පනය, ප්‍රබල
3. ප්‍රතිඵල, අපගමන, අවමාන, පරපෝෂිත, අවමංගල
4. සුදන, සමීප, දුෂ්කර, අනුලෝම, අකුසල්

13. පහත සඳහන් වරණවලින් විධික්‍රියා, පූර්වක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා පිළිවෙලින් යෙදී ඇති වරණය තෝරන්න.
1. කියද්දී, බලවයි, කරයි, නටමින්
2. කියන්න, බලා, කියන, කරවයි
3. කරනු, නටා, අඬවයි, බලබලා
4. සොයමින්, පිපේවා, නරඹා, නටා

14. "මම ගියේ පයින්, දරුවා මගේ" යන ප්‍රකාශයෙහි ඉරි ඇඳි පදවල නිවැරදි ව්‍යාකරණ වර්ගය දක්වෙන වරණය වන්නේ,
1. ප්‍රථම පුරුෂ හා මධ්‍යම පුරුෂ නාමපද වේ.
2. මධ්‍යම පුරුෂ හා ප්‍රථම පුරුෂ නාම පද වේ.
3. උත්තම පුරුෂ හා ප්‍රථම පුරුෂ නාම පද වේ.
4. උත්තම පුරුෂ හා මධ්‍යම පුරුෂ නාම පද වේ.

15. පහත සඳහන් වාක්‍යවල උපමාංවක් සහිත වරණය තෝරන්න.
1. සිත්දූපමාන වැව් තලා මතින් ඇදී
2. අම්මා සඳකි මම ඒ ලොව හිරුය රිදී
3. සූරිය මල අහස් තලේ සිනා මවන
4. නුඹ සාමඩුලු සඳ වෙළලපලු පැහැපත

16. ස්වර සන්ධිය සහ පූර්ව ස්වරලෝප සන්ධියට අයත් නිදසුන් පිළිවෙලින් දක්වෙන වරණය වන්නේ,
1. වමත, දකුණත
2. මුණිතුමා, සුරගන
3. ලකඹර, ගුරුතුමා
4. ළිංවතුර, තම්පළා

17. "මං තනන්නෝ" කෙටි කතාවේ රචකයා වන්නේ,
1. රත්න ශ්‍රී විජේසිංහ මහතාය.
2. කේ. ජයතිලක මහතාය.
3. මහගමසේකර මහතාය.
4. ගුණදාස අමරසේකර මහතාය.

18. ප්‍රාදේශීය බස් වහරේ "පුන්නව්වා" යනුවෙන් හඳුන්වන්නේ,
1. නිදි කෙරුවා යන්නය.
2. විසි කෙරුවා යන්නය.
3. බැලුවා යන්නය.
4. ඉර පැව්වා යන්නය.

19. පහත දක්වෙන ප්‍රකාශ වලින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
1. ශ ෂ, ස හ යනු නාසික්‍ය අක්ෂර වේ.
2. ප බ භ, ම යනු කණ්ඨජ අක්ෂර වේ.
3. ඤ, ණ , න, ම යනු සඤ්ඤක අක්ෂර වේ.
4. ය, ර, ල, ව යනු අර්ධ ස්වර වේ.

20. ගැළපෙන වරණය තෝරන්න.
1. එකුන් විසි - විසි එක
2. තුදුස් - දාහතර
3. සොළොස් - දහ අට
4. සූවිසි - දහනවය

21. දී ඇති අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.
පිළිකුලෙන් හෝ නොසැලකිල්ලෙන් සැලකීම
1. දී කිරට බළල්ලුන් සාක්කි
2. උඹරෝ කවද ද සහ කැවේ
3. එපා වාහෙට හොඳි බෙදන්නා වගේ
4. කලකදි වහලු කලකදි රජ වෙනවාලු

22. පහත සඳහන් වාක්‍යය නිවැරදිව කර්මකාරකයට හරවා ඇති වාක්‍යය තෝරන්න.
• ගුරුවරු සිසුන් යහමඟ යවති.
1. ගුරුවරුන් විසින් සිසුහු යහමඟ යැවෙති.
2. ගුරුවරු විසින් සිසුහු යහමඟ යවනු ලබති.
3. ගුරුවරුන් විසින් සිසුහු යහමඟ යවනු ලබයි.
4. ගුරුවරුන් විසින් සිසුන් යහමඟ යවනු ලබයි.

23. ධාතු ප්‍රකෘති වැරදි ලෙස යෙදී ඇති වරණය තෝරන්න.
1. ගයවයි - ගය, නටන්න - නට
2. බැලුවොත් - බලා , තබමු - තබා
3. අසති - අස, අමතනු - අමත
4. ලියමි - ලිය, කපයි - කප

24. පහත දක්වෙන කවියේ හිස්තැනට සුදුසු පද පේළිය තෝරන්න.

කුදේ ගසා නැගිටින කල
.......................................................... වෙවුලා
සොදේ විඳින සැප විඳිනට මෙකලා
ළඳේ නිසරු නොකරන් අප සියලා

1. යානේ උන් බමුණා බිම පෙරළා
2. තදේ කැසිත් කැස කැසපට අකලා
3. ඉසකේ පුපුරටි දත් කඩ තොල්ලා
4. බාන ලෙසට අල්ලාගෙන රැවුලා

25. සාම්ප්‍රදායික ගොවිතැනේ දී "හේන් ඇල්ලීම" යනුවෙන් හඳුන්වන්නේ,
1. මායිම් වෙන් කරගැනීම. 2. කැළයට ගිනි තැබීම 3. පළමු පඳුරට කෙටීම 4. කැලයක් තෝරා ගැනීම

• **අංක 26 සිට 28 දක්වා ප්‍රශ්නවල ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍යය තෝරන්න.**

26. 1. මා එය කියවා ඇත්තෙමි.
2. මිනිසුන් අවංක නොවන්නේ ඇයි
3. අපි සියල්ලෝම ලාංකිකයන් වෙමු.
4. සියලු මිනිස්සු සත්‍ය ගරුක වීම මැනවි.

27. 1. අප උදෑසනින් අවදි වූවෙමු.
2. මිනිසා නිවසක් ඉදි කරති.
3. ඔව්හු වේලාසනින් නික්ම යති.
4. නුඹලා හිරු උදාව නැරඹුවෙහි

28. 1. ඔව්හු මෙහි පැමිණීම යෙහෙකි.
2. ක්‍රීඩකයෝ හෙට දින හොඳින් ක්‍රීඩා කරනු ඇත.
3. අපි ඉවසීමෙන් කටයුතු කළ යුතු වෙමු.
4. රටවැසියෝ නීතිගරුක විය යුත්තේය.

29. හින්දු උත්සව අතුරින් "දීවාලී" හෙවත් "දීපාවලී" උත්සවය යෙදෙන්නේ
1. ජනවාරි, පෙබරවාරි මාස වලය
2. අප්‍රේල්, මැයි මාස වලය
3. ජූලි, අගෝස්තු මාස වලය
4. ඔක්තෝබර්, නොවැම්බර් මාස වලය

30. මුලින් ඇති පදයට විරුද්ධාර්ථයක් දෙන පදයක් ඇතුළත් නොවනු වරණය තෝරන්න.
1. උත්තම - අධම, පහත්, නීච, උතුම්
2. රිසි - නොරිසි, අකමැති, නුසුදුසු, අප්‍රිය
3. සසල - නිසසල, නිශ්චල, නිසල, නොසැලෙන
4. අසතුට - සතුට, සතොස, සොම්නස, ප්‍රහර්ෂය

31. මුලින් දක්වා ඇති පදයේ අර්ථයට සමානාර්ථයක් නොවන පදයක් ඇතුළත් පද පේළිය තෝරන්න.
1. ගිමන - ගිම, ග්‍රීස්ම, සරතැස, විඩාව
2. සකුණ - සියොත්, විහඟ, කුරුලු, සකලයෝ
3. සිනිඳු - මොළොක්, ගොරෝසු, කෝමල, සියුමැලි
4. කතාව - වත, කතන්දරය, අන්දරය, ප්‍රබන්ධය

32. මුලින් දී ඇති පදයේ නිවැරදි බහු අර්ථ පද පමණක් සහිත වරණය තෝරන්න.
1. දන - මිනිස්සු, දුවිල්ල, දානය, ජනතාව
2. අඹ - ජලය, කාන්තාව, පළතුර, කතුර
3. තුරු - තුඹ, ගස්, තරු, තෙක්
4. මල - කුසුම, උගුල, සිරුර, සමූහය

33. නිවැරදි තනිපදය සහිත පිළිතුර තෝරන්න.
1. කළගුණ දන්නා - අකෘතඥ
2. තම මතයට අනුව කටයුතු කරන - අත්තනෝමතික
3. නැවත ප්‍රයෝජනයට ගැනීම - ප්‍රතිසංස්කරණය
4. උඩගු බව ඇති - නිහතමානී

34. පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
1. "ර" අකුරට පරව යංශය නොයෙදේ.
2. යංශයට පෙර යෙදෙන ව්‍යංජනාක්ෂරය හල් අකුරක් වේ.
3. ස්වර අක්ෂර වලට නැවත පිල්ලම් යෙදිය හැකිය.
4. (අ)ං (අ)ඃ යනු ස්වර දෙකකි.

35. පහත දැක්වෙන ප්‍රකාශවල හිස්තැන් සඳහා අනුපිළිවෙලින් ගැළපෙන වචන යෙදී ඇති නිවැරදි වරණය තෝරන්න.
(අ) බොහෝ දෙනා පරලොව සැප ලබා ගනු .................... පින් දහම් කරති.
(ආ) ඔහු කළ ක්‍රියාව .................... අගය කෙරිණි.
(ඉ) මහගමසේකර .................... ප්‍රසිද්ධ ගත්කරුවෙකි.
(ඊ) ඔබ .................... ඇයත් මට මාගේ ඇස් දෙක වගෙයි.
1. මෙන්, යළි, සඳහා, වූ කලී
2. සඳහා, මෙන්, වූකලී, යළි
3. සඳහා යළි, වූකලී, මෙන්
4. වූකලී, මෙන්, සඳහා, යළි

36. පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
1. අත්හැරුණු අකුරු, පද හෝ වාක්‍යය නැවත එක් කිරීමේදී කාකපාදය (⋏) යෙදේ.
2. පහතින් දක්වා ඇති බව දැක්වීමට කොමාව (, ) යෙදේ.
3. යම් ප්‍රකාශයක් වඩාත් පැහැදිලි කිරීමට තිත්පෙළ (.......) යෙදේ.
4. උපුටා දැක්වීමක දී වරහන් ( ) යොදනු ලබයි.

37. සඤ්ඤක අකුරු පමණක් ඇතුළත් වරණය තෝරන්න.
1. ක, ච, ට, ත, ප
2. ඟ, ඦ, ඬ, ඳ, ඹ
3. ශ, ෂ, ස, හ, ෆ
4. න, ණ, ල, ළ, ම

38. මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් නොවන පදයක් සහිත වරණය තෝරන්න.
1. කෘදන්ත - රඟන, නටන, ගයන, වයන
2. නිපාත - ද, සහ, මෙන්, අයුරු
3. ක්‍රියාපද - කඩා, බලා, බලන්නා, අඬමින්
4. සන්ධි - යමෙනන, නුවනග, පිරියම්, දැගිලි

39. සම්පකාර්ථයෙහි නොයෙදෙන පදයක් සහිත වරණය තෝරන්න.
1. කමත - කලවිට, උප්පිඩ, යතුර, දුතිගොයියා
2. හේන් ගොවිතැන - වාං පතුල්, මහළුකා, ගිනියාදින්න, අක්වැස්ස
3. මැටි කර්මාන්තය - මැටිකෝව, සකපෝරුව, කුම්භකාර, කලාතයා
4. ධීවර කර්මාන්තය - ගඟුලාව, වාරකන්, කෝඩය, මාරියාව

40. මුලින් දී ඇති වාක්‍යයේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වාක්‍යය තෝරන්න.
" වාච්‍යාර්ථය ඉක්මවා ව්‍යංගාර්ථය ජනනය කෙරෙන ආකාරයට කවියා බස හසුරුවයි."

1. වදනේ අරුත ඉක්මවා සැඟවුණු අරුතක් දනෙන සේ කවියා කවියක් තනයි.
2. පාඨකයාගේ දැනුම ඉක්මවා රසය මතුවන ආකාරයට කවියා බස හසුරුවයි.
3. ධ්වනිතාර්ථයට වඩා සැඟවුණු අර්ථයට මුල් තැන දී කවියා භාෂාව යොදා ගනියි.
4. වචනයේ අරුතට වඩා සැඟවුණු අරුතක් ඇති වන සේ කවියා බස යොදා ගනී.

ලකුණු (1 X 40= 40 යි

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province 21158

10 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2022(2023) | 21 S I.II

නම: ..................................... **සිංහල භාෂාව හා සාහිත්‍යය** කාලය පැය දෙකයි

## II කොටස

**සැලකිය යුතුයි:**

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු සංඛ්‍යාව 80 කි.**

(01) (i) සිට (x)තෙක් ඇති සියලුම ප්‍රශ්නවල අනුකොටස් වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනු කොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් කෙටි ඉරක් අඳින්න.

i. පහත සඳහන් අක්ෂර වර්ග හැඳින්වීමට යෙදෙන නම් ලියන්න.
(අ) ශ, ෂ, ස, හ, ෆ (ආ) ත, ථ, ද, ධ, න

ii. පහත දක්වෙන අක්ෂර යෙදෙන වචනය බැගින් ලියන්න.
(අ) ඎ (ආ) ෆ

iii. (අ) පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස්ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.
බොහෝ දරුවන් පාසල් පුස්ථකාල පොත් කියවීම අතහැර පරිඝණක ක්‍රීඩාවලට පමණක් යොමුවීම නිසා වැඩිහිටියන්ගේ දෝෂ දර්ශනයට ලක්වන අවස්ථා දැකිය හැකිය.

iv. පහත සඳහන් වාක්‍යයෙහි ඇතුළත් උපසර්ග පද දෙක උපුටා ලියන්න.
මාර්ගය දෙපස හොඳින් වැඩුණු සුවිශාල ගස් පදිකයින්ට නිර්ලෝභී ව සෙවණ ලබාදෙයි.

v. පහත සඳහන් කවි පදවල ඉරි ඇඳි පද අයත් ක්‍රියා වර්ගය නම් කරන්න.
(අ) "කරව පියාසර සකි කොන්ත ගං තොටින්"
(ආ) "විඳ විඳ දහම් මන හර"

vi. පහත දක්වා ඇති වචනවල යටින් ඉරි ඇඳි අකුරේ යෙදී ඇති පිල්ලම නම් කරන්න.
(අ) රූපියල (ආ) ප්‍රවිෂ්ට

vii. පහත දක්වෙන විසන්ධි පද සන්ධි ඉකාට ලියන්න.
(අ)පුන + උත්පත්තිය (ආ) පූජා + උපහාර

viii. මුලින් දීඇති අදහසට ගැළපෙන තනිපදය ලියන්න.
(අ) අපූර්ව වස්තු නිර්මාණය කිරීමේ ඇති හැකියාව
(ආ) සිදු කළ වැරැද්ද හෝ සිදු වූ දේ පැවසීම.

ix. පහත දැක්වෙන කර්තෘ කාරක වාක්‍යය කර්මකාරකයටත්,කර්ම කාරක වාක්‍යය කර්තෘ කාරකයටත් හරවා ලියන්න.
(අ) උවසු උවැසියෝ පහන් දැල්වූහ. (ආ) මව විසින් මම පාප මිත්‍රයන්ගෙන් රකින ලද්දෙමි.

x. පහත දක්වෙන කියමන් සඳහා ගැළපෙන ප්‍රස්තාව පිරුළ ලියන්න.
(අ) පිහිටක් පතා ගිය තැනින් විපතක් සිදුවීම. (ආ) අරමුණකින් තොරව වැඩ කිරීම.

(2x10 = 20)

(02) පහත සඳහන් (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන වචන 250 කට නොඅඩු වන සේ රචනයක් ලියන්න. එක් එක් විස්තරයට මුලින් වරහන් තුළ දී ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. සුදුසු මාතෘකාවක් ද යොදන්න.

(අ) ශ්‍රී ලංකාව අතීතයේ සිටම ගොවිතැන මුල්කරගත් සමාජ ආර්ථිකයක් සහිත රටකි. වැවයි දාගැබයි ගමයි පන්සලයි යන සංකල්පය එහි මූලික පදනමයි. නමුත් පසුකාලීනව එය ආනයන අපනයන ආර්ථිකයක් දක්වා වෙනස් විය. වර්තමානයේ ගොවියා ජීවත් වන්නේ දෙලොවක් අතර අතරමං වීඇති අයෙකු ලෙසය.

(ආ) මිනිසාගේ ඇතැම් නව සොයාගැනීම් හා නිෂ්පාදන පරිසරයට තර්ජනයක්ව පවතී. ජල මූලාශ්‍ර අපවිත්‍ර කිරීම, කැලෑ කැපීම, වනාන්තර ඇතුළත මාර්ගවල වාහන වලින් සවාරි ගොස් සතුන්ගේ නිදහසට බාධාකාරීවන ලෙස හැසිරෙන අවස්ථාද දැකිය හැකිය. මෙවැනි ක්‍රියාකාරකම් නිසා ස්වභාවික විපත්වලටද මුහුණදීමට අපට සිදුවී ඇත. මේ තත්වයන් මගහරවා පරිසරය රැක ගැනීමට අප උත්සුක විය යුතුය.

යොමු කළ යුතුය.

(ඊ) වැසි දිනවලදී ඔරු පැදීමට නොයන ලෙස තාත්තා සුනිමල්ට කිහිපවරක් පවසා ඇත. පසුගියදා ඇද හැළුණු මහා ධාරානිපාත වර්ෂාවත් සමඟ ගංදිය පිටාර ගලන්නට විය. මේ දුටු ගමේ තරුණයන්ට ඔරුපැදීමේ අදහසක් ඉස්මතු විය. කෙසෙල් කඳන්වලින් පාරුවක් සාදාගත් ඔව්හු ගං දියේ පාරු පදින්නට විය. සුදුසු අවස්ථාව ඇතුළත් කරමින් ගැළපෙන මාතෘකාවක් ද යොදමින් නිර්මාණයක් කරන්න.

(ලකුණු 25)

(03) පහත දැක්වෙන ඡේදය වචන 65-75 අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබේ සාරාංශයේ ඇතුළත් වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

වර්තමාන ලෝකය දිනෙන් දින ඇදහිය නොහැකි වේගයෙන් වෙනස් වේ. ලෝකයේ දැනුම ද ශීඝ්‍රයෙන් ප්‍රසාරණය වේ. මෙම පසුබිම යටතේ නූතන ශිෂ්‍යයා සුවිශේෂ කරුණු හෝ තොරතුරු කටපාඩම් කිරීමට යොමු කිරීම තව දුරටත් අධ්‍යාපන පද්ධතියක ප්‍රමුඛ කාර්යය නොවේ. පූර්වයෙන් නිශ්චය කළ නොහැකි තත්ත්ව තුළ මතුවන ගැටලු සඳහා විසඳුම් සෙවිය හැකි නම්‍යශීලී, ගවේශණාත්මක, නිර්මාණශීලී චින්තනයට වැදගත් තැනක් හිමිවේ. මෙහි දී ඊට අනුගත වීමට ශිෂ්‍යයන්ට සාපේක්ෂ වශයෙන් තම ගුරුවරුන්ගෙන්, දෙමාපියන්ගෙන්, වැඩිහිටියන්ගෙන් ලබාගන්නා දැනුමෙන් යැපෙන තත්ත්වයෙන් මිදී වෙනත් සමාජ තත්ත්වයන්ට හැඩ ගැසිය හැකි ස්වාධීනව ඉගෙනුම් ලබන පරිණත පුද්ගලයන් බවට පත්වීමට උපකාර කළ යුතුය. එනම් ගවේෂණශීලී, නිර්මාණශීලී වී සාම්ප්‍රදායික දැනුම් මූලාශ්‍රය සමඟ කටයුතු කිරීමේ හැකියාව ලැබිය යුතුය. විද්වතුන් පෙන්වා දෙන පරිදි අනාගත පුරවැසියන්ට චින්තකයන් බවට පත්වීමට ඉඩකඩ සැලසීමෙන් මෙම අභියෝගය ජයගත හැකිය . (ලකුණු 10)

(04) පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට උත්තර ලියන්න.

ශ්‍රී සෝරත මාහිමිපාණන් වහන්සේගේ ශාස්ත්‍රධරත්වයත්, ධර්මධරත්වයත් මතුව පෙනෙන්නේ උන්වහන්සේ විසින් සංස්කරණය කරන ලද ග්‍රන්ථ දෙස බැලීමෙනි. වත්මන් පඬිවරුන්ට පවා අර්ථාවබෝධයට අපහසු කව් සිළුමිණ, කාදම්බරිය වැනි චිර සම්භාවිත ග්‍රන්ථ රැසක් සඳහා සෝරත හිමිපාණන් විසින් ව්‍යාඛ්‍යාන පරිකතා ලියැවිණි. කව්සිළුමිණ කල්පලතා නමින් පළ කළ ව්‍යාඛ්‍යාණය ශාස්ත්‍රාභිලාෂීන් ගේ සිත්ගත් කෘතියක් විය. පරෙවි සංදේශය ආදි සංදේශ ග්‍රන්ථද පොළොන්නරු සමයේ ලියැවුණු අමාවතුර, බුත්සරණ, දහම්සරණ , සඟ සරණ ආදී ග්‍රන්ථ මෙන්ම ·දහම්සොඬ දා කව වැනි ග්‍රන්ථද උන්වහන්සේ අතින් සංශෝධනය විය.

i. මෙහි සඳහන් වන්නේ කවුරුන් ගැනද?
ii. උන්වහන්සේගේ කුමන ක්‍රියාවක් ගැන මෙහි සඳහන් වේද?
iii. මෙහි සඳහන් චිරසම්භාවිත ග්‍රන්ථ දෙකක් ලියන්න.
iv. මෙහි සඳහන් කර ඇති පොළොන්නරු යුගයට අයත් ග්‍රන්ථ දෙකක් සඳහන් කරන්න.
v. "ශාස්ත්‍රධර" හා "ධර්මධර" යන වචනවල තේරුම ලියන්න. (ලකුණු.2x5 = 10)

(05) කැකිරාව , සමඟිපුර ගම්මානය කලක සිට විදුලිබලය අපේක්ෂාවෙන් සිටින ගම්මානයකි. එම ගමෙහි පවුල් 200 ක් පමණ සිටිති. ගොවිතැනින් හා සත්ව පාලනයෙන් දිවි ගෙවන ඔවුහු කලෙක සිට තම නිවාසවලට විදුලිබලය ලබාගැනීම සඳහා අවශ්‍ය මූලික කටයුතු ද සූදානම් කරගෙන සිටිති. කාලයක සිට වන අලි තර්ජනයට ද මුහුණ පා සිටින ඔවුහු විදුලි වැටක් ලබාගැනීම සඳහා ද අපේක්ෂා කරති.

විදුලි බලය ලැබීමෙන් ගමට වන සේවය ගැනද සඳහන් කරමින් එම ප්‍රදේශයේ විදුලි අධිකාරිතුමා වෙත යවන ලිපිය ලියන්න. ඔබ එම ගමේ ග්‍රාම සංවර්ධන සමිතියේ ලේකම් යැයි සිතන්න. (වචන 100 ක් පමණ සෑහේ)

(ලකුණු 15)

නැතහොත්,

ගෙවතු වගාව දිරිමත් කිරීමේ අරමුණින් එළවලු බීජ වර්ග කීපයක් ඇතුළත් බීජවර්ග පැකට්ටුවක් බෙදා දෙන බව සඳහන් කරමින් ඒ සඳහා පැමිණෙන ලෙස දන්වන අත් පත්‍රිකාව සකස් කරන්න. ඔබගේ ප්‍රදේශයේ ගොවිජන සංවිධානයේ ගොවිජන සංවර්ධන නිලධාරී ඔබ යැයි සිතා වචන 100 කින් පමණ අත් පත්‍රිකාවක් ලියන්න.

(ලකුණු 15)

සියලුම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province 20928

10 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2022(2023) | 21 S III

නම: ..........................................

සිංහල භාෂාව හා සාහිත්‍යය

කාලය පැය දෙකයි

## III පත්‍රය

සැලකිය යුතුයි :

- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු ලියන්න.
- 1,2,3,4 ප්‍රශ්නවලටත් 5,6,7 ප්‍රශ්න වලින් එකකටත් පිළිතුරු ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.

(01) i සිට x දක්වා ඇති සියලුම අනුකොටස් වලට කෙටි පිළිතුරු ලියන්න.
කිසියම් අනුකොටසකට ඔබ පිළිතුරු නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

i. "මම බාලයෙමි තොපගේ මුනුබුරු තරමට ඇත්තෙමි"
(අ) ඉහත ප්‍රකාශයේ මම යනු කවුරුන්ද ?
(ආ) මේ ප්‍රකාශය කළේ කා හටද ?

ii. අනුවණ කම් කලේ
ගුරුන් ගුණ සිහි නොකළේ
..............................................................
..............................................................
(අ) මෙහි ඉතිරි කවි පද පේළි දෙක සම්පූර්ණ කරන්න.
(ආ)ගුත්තිල කාව්‍ය රචනා කිරීමට ආරාධනා කළේ කවුද?

iii. (අ)"නන්දන ගීත" කවුරුන් විසින් රචනා කළ කෘතියක් ද?
(ආ) එම රචකයාගේ තවත් කෘතියක් නම් කරන්න.

iv. (අ) සිංහබාහු නාට්‍යයේ රචකයා නම් කරන්න.
(ආ) ඔහු විසින් රචිත සාහිත්‍ය විචාර ග්‍රන්ථයක් නම් කරන්න.

v. (අ) ජනකවි අතර ඇති විවේකය, විනෝදයෙන් ගත කිරීම සඳහා කියූ කවි හඳුන්වන නම කුමක්ද ?
(ආ) සිංහල ජන කවියට අනුරාධපුර යුගය දක්වා දිවෙන ඉතිහාසයක් ඇති බවට ඇති සාක්ෂිය කුමක් ද?

vi. (අ) ජාතක කතා පොත මූලාශ්‍ර කොටගෙන රචිත ගී කාව්‍යය 2 ක් නම් කරන්න.
(ආ) ජාතක කතා පොත රචිත යුගය නම් කරන්න.

vii. "තමාගේ අනාගතය පිළිබඳ බියක්ද ඈ තුළ පැන නැග එන්ට වනි"
(අ) මෙහි සඳහන් වන්නේ කවුරුන් පිළිබඳවද ?
(ආ) මේ කොටස උපුටා ගත් ග්‍රන්ථය කුමක් ද?

viii. ..............................................................................
..............................................................................
කවදා කොතනකදී හෝ මහ මුහුද හිමි
හමුවුණු කෙණෙහි මා සතු බර ඔහුට දෙමි
(අ) කවියේ මුල් පද දෙක සම්පූර්ණ කරන්න.
(ආ) මෙහි ඇතුළත් රූපකාර්ථවත් යෙදුම උපුටා දක්වන්න.

ix. (අ) ගුත්තිල කාව්‍යයේ ආරම්භක කවිය කිනම් ගණයකින් ලියවී ඇත්ද?
(ආ) ගුත්තිල කාව්‍ය රචනා කළ යුගය කුමක් ද?

x. (අ) "විලේජ් ඉන් ද ජංගල්" කෘතිය ලියවුණු වර්ෂය කුමක් ද?
(ආ) ඉහත කෘතියේ අනුවර්තකයා කවුද? (ලකුණු 2x10=20)

(02) i. පණ්ඩිතයන් වහන්සේ ගිරා පෝතකයන්ට කළ මනා සත්කාර කොට හෙවත් මීයෙන් හැනූ විලඳ කවා, මී පැන් පොවා, බෙත් තෙලින් <u>පියා සඟල මැඬ</u>, මොළොක් ඇතිරිලි අතුරන ලද <u>රන් මැදිරියෙහි</u> සතප්පා ..."

(අ) ඉරි ඇඳි පදවල අර්ථ ලියන්න.
(ආ)සමස්ත පාඨයෙහිම අර්ථය ලිහිල් බසින් ලියන්න.

ii. රත් විමනේ සිටි මුත් දුක නැති වෙද්ද
පැණි මීයේ කෑ මුත් බඩගිනි නැද්ද
මිණි බරණින් සැදූ මුත් ගත නොදිරද්ද
පැණි වරකා ගසටත් මෙහෙණ නොවදිද්ද

(අ) ඉරි ඇඳි පදවල අර්ථ ලියන්න.
(ආ) මෙම පද්‍යයෙන් දෙන උපදේශය කුමක් ද?

iii. තත මතු ද සිත්දේ
පිළිමල් දප ද සිත්දේ
යස දිගත ඇත්දේ
විජය සිරි සඳ ගෙන වැළැත්දේ
(අ) අංකිත පදවල අර්ථ ලියන්න.
(ආ) සම්පූර්ණ කවියේ අදහස ලියන්න.

iv. "මිනිහා අනුමානයක් නෑ මැරෙන්ඩ ඇති"
(අ) මෙසේ ප්‍රකාශ කලේ කවරෙක් ද?
(ආ) මෙසේ ප්‍රකාශ කළ අවස්ථාව කුමක් ද?

v. "නුඹගේද නුඹ නැගණියන්ගේ ද යහපත පිණිස මම නුඹ පියාණන් හැර පියා යත්නට සනිටුහන් කර ගතිමි. මා මෙසේ කරන්නේ හද තුළ ඇති මහත් වේදනාවෙනි. දිවිහිමියෙන් මා ඒ වේදනාවෙන් පෙළෙමි."
(අ) මෙහි සඳහන් පරිදි මව සිදුකළ ක්‍රියාව කුමක් ද?
(ආ) අංකිත පදවල අරුත් සපයන්න. (ලකුණු 4x5 = 20)

(03) i. උත්සාහය අත් නොහැරීමත්
ii. රාජ පාක්ෂික භාවයත්
යන ලක්ෂණ අතින් මහෞෂධ පඬිතුමා හා කේවට්ට බමුණා යන දෙදෙනාම එක සමාන වේ. එක් කරුණකට නිදසුන් 2 බැගින් දක්වමින් විමසන්න.

නැතහොත්

i. සර්වකාලීන වටිනාකමක් සහිත උපදේශ සැපයීමත්
ii. සරල ගැමි ජන බස භාවිතයත් යන කරුණු නිසා උපදේශ කාව්‍ය ජනප්‍රිය වී ඇති අයුරු එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් පැහැදිලි කරන්න. (ල. 15)

(04) i. අවස්ථා සිද්ධි නිරූපණයත්
ii. කාව්‍යාලංකාර භාවිතයත්
විශිෂ්ට ලෙස සිදු කිරීම ගුත්තිල කාව්‍යය උසස් සාහිත්‍යය නිර්මාණයක් වීමට හේතු විය. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් විමසන්න.

නැතහොත්,

බැද්දේගම නවකතාවේ,
i. පුංචි මැණිකාගේ චරිතයත්
ii. කර්ලිනා හාමිගේ චරිතයත්,
නිරූපණය වී ඇති අයුරු එක් එක් චරිතයට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

(05) "යෞවනයෙකුගේ හැඩිදැඩි ගති ස්වභාවය මෙන්ම ධනය, බලය වෙනුවෙන් තම සමීපතමයන් වුව හැර දමන පෘථග්ජන මිනිස් ස්වභාවයද සිංහබාහු චරිතය තුළින් ඉස්මතු වේ" උදාහරණ තුනක් දෙමින් විමසන්න. (ලකුණු 10)

(06) "ගංගාවේ සංගීතය කවි පන්තියෙන් කතුවරයා ගැඹුරු ජීවන දර්ශනයක් ඉදිරිපත් කරයි." නිදසුන් 03 ක් දක්වමින් විමසන්න. (ලකුණු 10)

(07) "දරුවෙකුගේ සිත තුළ දේශාභිමානී හැඟීම් මතු කිරීමට 'මුනි සිරිපා සිඹිමින්නේ' පද්‍ය පන්තිය මඟින් ලබාදෙන උපදෙස් සාර්ථකය" කවිපෙළ ඇසුරින් උදාහරණ සපයමින් මේ කියමන පැහැදිලි කරන්න. (ලකුණු 10)